**යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2016**

-----------------------------------------------------------------------------------

යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2710 - එස්ආර්අයි (සාමාන්‍ය මෙහෙයුම්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ අංක 2711 - එස්ආර්අයි (එස්එෆ්) (විශේෂ මෙහෙයුම්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ උතුරු පළාත් සභාව මඟින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත් වන පදිංචිකරුවන් සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ යාපනය අර්ධද්වීපයේ ජල සම්පත් ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතිය සමන්විත වන්නේ (අ) ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම (ආ) යාපනය ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම සහ (ඇ) ක්‍රියාත්මක කිරීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා යාපනය ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීමයි. ණය ගිවිසුම් අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන සංරචක යටතේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,460.07 කට සමාන එජඩො මිලියන 147.32 ක් විය. ඉන් රු.මිලියන 8,541.76 කට සමාන එජඩො මිලියන 76.45 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර රු.මිලියන 5,363.04 කට සමාන එජඩො මිලියන 48 ක් සැපයීමට "එජන්ස් ෆ්‍රැන්ෂයිස් ඩි ඩිවලප්මන්ට්" (Agence Francaise de Development) එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 2,555.27 කට සමාන එජඩො මිලියන 22.87 ක් සැපයීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 පෙබරවාරි 15 දින ආරම්භ කරන ලද අතර 2017 අගෝස්තු 14 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2020 මැයි 14 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ

විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය**

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථකිරීම සඳහා ඉදිරිපත් කර ඇති වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

---

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

2016 දෙසැම්බර් 31 දින දක්වා ණය අංක 2710 එස්ආර්අයි යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් අයකරන ලද රු.මිලියන 19.4 ක් වූ බැඳීම් ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. තවද ණය නියෝජිතායතනය විසින් 2016 දෙසැම්බර් 31 දක්වා අයකරන ලද රු.මිලියන 54.5 ක් වූ පොලී ගාස්තු ද ව්‍යාපෘතියේ වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2013 නොවැම්බර් 29 දිනැති අංක 230/2013 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, ඉදිකිරීම් කාල පරිච්ඡේදය තුළ දරන ලද පොලී හා වෙනත් ගාස්තු ප්‍රාග්ධනිත කළ යුතු වේ.

### 2.2.2 නොසැසඳූ ශේෂ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ කෙරීගෙන යන වැඩ රු.මිලියන 2,023 ක් විය. කෙසේ වුවද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, එය රු.මිලියන 2,236 ක් ලෙස දක්වා තිබුණි. රු.මිලියන 213 ක් වූ වෙනස සසඳා නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ආපසු ගැනීම් ඉල්ලුම්පත්‍ර 12 ක් මගින් රු.මිලියන 505.98 ක මුදලක් ඉල්ලුම් කර ලබාගෙන තිබුණි. කෙසේ වුවද, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු වාර්තා අනුව, රු.මිලියන 536.73 ක මුදලක් ඉල්ලුම්කර ලබාගෙන තිබුණි. රු.මිලියන 30.75 ක් වූ වෙනස සඳහා හේතු පැහැදිලි කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව, රු.මිලියන 16.45 ක් පිරිවැය වූ කිලිනොච්චි ප්‍රදේශයේ ඉඩම් සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් අත්කරගෙන තිබුණි. කෙසේ වුවද, කිලිනොච්චි, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යාලයෙන් ලැබුණු තොරතුරුවලට අනුව, අත්කරගත් ඉඩම්වල පිරිවැය රු.මිලියන 13.91 ක් විය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2016 වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 76.45 | 8,541.76 | 1,235.00 | 8.50 | 1,236.43 | 18.55 | 2,409.06 |
| ඒඑෆ්ඩී | 48.00 | 5,363.04 | - | - | - | 0.98 | 124.64 |
| ශ්‍රී ලං ර | 22.87 | 2,555.27 | 325.00 | 2.20 | 321.04 | 4.76 | 618.19 |
| | 147.32 | 16,460.07 | 1,560.00 | 10.70 | 1,557.47 | 24.29 | 3,151.89 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජල සම්පත් බෙදාගැනීම මත ඉරණමඩු ප්‍රදේශයේ ගොවීන්ගෙන් වූ දැඩි විරෝධය හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කළ දින සිට වර්ෂ 05 මාස 10 ක් ඉකුත් වීමෙන් පසුව 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 16,460.07 කට සමාන එජඩො මිලියන 147.32 ක්වූ මුළු වෙන්කිරීමෙන් රු.මිලියන 3,151.89 කට සමාන එජඩො මිලියන 24.29 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) ඉරණමඩු ජලාශයේ නව ජල තුළු මුව ගෙනයාම් මධ්‍යස්ථානය (new water intake lift station), පිරිසිදු කිරීම් පිරියත, ඉරණමඩු ජලාශයේ පොම්ප කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම හා යාපනය මහ නගර සභා ප්‍රදේශය සඳහා පිරිසිදු නොකළ හා පිරිසිදු කළ ජලය සම්ප්‍රේෂණ ප්‍රධාන නළය එළීම සඳහා රු.මිලියන 5,363.04 කට සමාන එජඩො මිලියන 48 ක් සැපයීමට ඒජන්ස් ෆ්‍රැන්ෂයිස් ඩී ඩිවලප්මන්ට් සමඟ එළඹි ණය ගිවිසුම ව්‍යාපෘතියේ කටයුතු අත්හැරීම හේතුවෙන් 2015 ඔක්තෝබර් 06 දින අවසන් කර තිබුණි. වෙන්කිරීමෙන් සියයට 2.3 ක් නියෝජනය වන රු.මිලියන 124.64 ක මුදලක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 11.90 ක වන්දි මුදලක් හා රු.මිලියන 15.2 ක් වූ ඇගයීම් ගාස්තු ගෙවීමට සිදු වී තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

**------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත 3.1 (අ) ඡේදයේ සඳහන් පරිදි, යාපනය අර්ධද්වීපය සඳහා ප්‍රධාන ජල ප්‍රභවයක් ලෙස ඉරණමඩු ජලාශය යොදා ගැනීමට එරෙහිව ඉරණමඩු ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගෙන් වූ දැඩි විරෝධතා හේතුවෙන් ව්‍යාපෘති කටයුතු අත්හැර දමා තිබුණි. කෙසේ වුවද යාපනය අර්ධද්වීපයේ ජල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා මුහුදු ජලයේ ලුණු ඉවත්කිරීමේ කාර්යය සඳහා ව්‍යාපෘතියේ කාර්යයන් වෙනස් කිරීමට 2015 ජුලි 15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. කෙසේ වුවද වැඩ පිළිබඳ විෂය පථය වෙනස් කිරීමට සැලසුම් සහ ඒ සඳහා පිරිවැය ඇස්තමේන්තු 2016 දෙසැම්බර් 31 වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ආ) යාපනය අර්ධද්වීපයේ ජලය ආරක්ෂා කර ගැනීම සඳහා එජන්ස් ෆ්‍රැන්ෂයිස් ඩී ඩිවෙලොප්මන්ට් සමඟ එළඹි ගිවිසුම යටතේ සලසන ලද රු.මිලියන 3,982 කට සමාන එජඩො මිලියන 35.64 ක වෙන්කිරීම් යටතේ මලාපවහන එකතුකිරීමේ පද්ධතියක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම, මලාපවහන පිරිසිදු කිරීමේ පිරියත, අපද්‍රව්‍ය ගලායන මුහුදු පිටාර මෝයක් සහ නඩත්තු උපකරණ සැපයීම ඇතුළත් යාපනය අර්ධද්වීපයේ මලාපවහන හා සනීපාරක්ෂක පද්ධති වැඩි දියුණු කිරීමට අදාළ වැඩ 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. කෙසේ වුවද, ඒ පිළිබඳ ණය ගිවිසුම අවසන් කිරීම හේතුවෙන් එම ඉදිකිරීම් වැඩ සමාලෝචිත වර්ෂයේදී අත්හිටුවා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------**

පැකේජ 01 හා 02 යටතේ උස් ජල කුළුණු ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තු පිළිවෙලින් රු.මිලියන 525 ක හා රු.මිලියන 614 ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2014 වර්ෂයේදී පිරිනමා තිබුණි. ඉදිකිරීම් සැලැස්ම අනුව, කොන්ත්‍රාත් කාර්යයන් 2016 අගෝස්තු 17 දින නිම කළ යුතු විය. සැලසුම් කරන ලද කාල පරිච්ඡේදය තුළ භූ විද්‍යා පරීක්ෂණ නිම කිරීමේ ප්‍රමාදයන් හා ඉදිකිරීම් සැලසුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තු දෙකෙහිම භෞතික ප්‍රගතිය සියයට 50 ක් වූ අඩු මට්ටමක පැවතුණි.

**3.4** **මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු**

**-----------------------------------------**

මුදල් රෙගුලාසි 134(3) සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය කර නොතිබුණි.